**ශීර්ෂය - 19 පාර්ලිමේන්තුවේ විපක්ෂ නායකතුමාගේ කාර්යාලය**

---

1. **මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

පාර්ලිමේන්තුවේ විපක්ෂ නායකතුමාගේ කාර්යාලයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව පාර්ලිමේන්තුවේ විපක්ෂ නායකතුමාගේ කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2021 ජුනි 30 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව පාර්ලිමේන්තුවේ විපක්ෂ නායකතුමාගේ කාර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 ජූලි 26 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට පාර්ලිමේන්තුවේ විපක්ෂ නායකතුමාගේ කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව පාර්ලිමේන්තුවේ විපක්ෂ නායකතුමාගේ කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව පාර්ලිමේන්තුවේ විපක්ෂ නායකතුමාගේ කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේ දී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප බව,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය ප්‍රකාශන චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල නොවීම

රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ මාර්ගෝපදේශ අංක කාශන පිළියෙල ප්‍රකාරව මූල්‍යප්‍ර 06 තාවයන්ගෙන් බැහැර වූ අවස්ථාඑම අවශ්‍ය ,කළ යුතුව තිබුණත්වක් පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මාර්ගෝපදේශහි 3.1 ඡේදය ප්‍රකාරව මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය භාණ්ඩාගාරයේ පොත්වල සඳහන් සංඛ්‍යා පදනම් කරගෙන පිළියෙල කළ යුතුව වුවද, මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ අත්තිකාරම් ලැබීම් සහ ගෙවීම් රු.211,450 ක් භාණ්ඩාගාර පොත්වල සඳහන් සංඛ්‍යාවලට වඩා අඩුවෙන් දක්වා තිබුණි. | මෙම රු.211,450 ක වටිනාකම කුමක් නිසා ඇති වුණිද යන්න හඳුනා ගෙන ඇති අතර මෙම වෙනස නිවැරදි කිරීමට රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව වෙතින් ලද උපදෙස් අනුව කටයුතු කර ඇති බැවින් ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී මෙය නිවැරදිවේ. | මාර්ගෝපදේශ අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතු වේ. |

### 1.6.2 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ අත්තිකාරම් අයකර ගැනීම් රු.1,625,100 ක් ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය යටතේ පෙන්වා නොතිබුණි. | සමාලෝචිත වර්ෂයේ දී අත්තිකාරම් අයකර ගැනීම් රු.1,625,100 ක් කාර්යාලයේ පොත්වල සඳහන් කර තිබුණ ද, එම වටිනාකම ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය යටතේ පෙන්වා නොතිබුණි. | නිවැරදිව මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකස් කළ යුතු වේ. |

### 1.6.3 අග්‍රිම ශේෂය

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| අග්‍රිම ගිණුමෙහි දැක්වෙන වෙනත් මූලාශ්‍රවලින් ලද රු.106,110 ක් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ ඇතුළත් කර නොතිබුණි. | අග්‍රිම ගිණුම හා භාණ්ඩාගාරයෙන් නිකුත් කරන ලද SA-70 ප්‍රකාශයේ ප්‍රකාශ කර ඇති වෙනස භාණ්ඩාගාරය සමඟ සම්බන්ධවී නිරවුල් කර ගැනීමට කටයුතු කරන බව | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව සකස් කළ යුතු වේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 බැරකම් හා බැඳීම්වලට එළඹීම

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කෙරේ .

| විගණන නිරීක්ෂණය | | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 3.4 ඡේදය ප්‍රකාරව, භාණ්ඩාගාරයේ බැඳීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශයෙහි ඇතුළත් නොවූ නමුත් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු බැරකම් රු.307,521 ක් 2021 වර්ෂයේ දී නිරවුල් කර තිබුණි. | පෙර වර්ෂයේ ගෙවිය යුතුව තිබූ රු.307,521 ක මුදල ගිණුම් පියවන අවස්ථාවේ දී ඉදිරිපත් නොවූන අතර අනිවාර්යය ගෙවීමක් වූ බැවින් 2021 වර්ෂයේ ප්‍රතිපාදන උපයෝගී කරගෙන පියවීම් කර ඇත. | චක්‍රලේඛ ප්‍රකාරව බැරකම් නිවැරදිව හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශන සකස් කළ යුතු වේ. |
| (ආ) | මුදල් රෙගුලාසි 94(2) ප්‍රකාරව, සැපයුම් හා සේවා සම්බන්ධයෙන් වාර්ෂිකව පුනරාවර්තනය වන රු.475,407 ක බැරකම්, බැරකම් පිළිබඳ ප්‍රකාශයේ දක්වා නොතිබුණි. | එකඟ වේ. | මුදල් රෙගුලාසිය ප්‍රකාරව බැරකම් නිවැරදිව හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශන හා සටහන් සකස් කළ යුතු වේ. |

### 2.2 බැංකු ගිණුම් මෙහෙයවීම

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 දෙසැම්බර් 31 දිනට බැංකු ගිණුම් පිළිබඳ තත්ත්ව වාර්තාවෙහි, බැංකුවට ඉදිරිපත් නොකරන ලද මාස 06 ට වැඩි රු.38,375 ක් වටිනා චෙක්පත් 02 ක් ඇතුළත් කර නොතිබුණි. | මෙම චෙක්පත සම්බන්ධයෙන් ඉදිරියේ දී මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කරනු ලබන බව | මූල්‍ය ප්‍රකාශනවල සටහන් යටතේ නිවැරදි තොරතුරු ඇතුළත් කළ යුතු වේ. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 සැලසුම් කිරීම.**

**3.1.1 ක්‍රියාකාරී සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 03 ඡේදය ප්‍රකාරව, සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කරන ලද ක්‍රියාකාරී සැලැස්ම තුල වාර්ෂික ක්‍රියාකාරකම් සඳහා වන අක්මුදල් අවශ්‍යතා සැලැස්ම සහ ප්‍රසම්පාදන සැලැස්ම අන්තර්ගත වී නොතිබුණි. | අක්මුදල් අවශ්‍යතා සැලැස්ම හා ප්‍රසම්පාදන සැලැස්ම සකස්කර තිබුණද ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර නොමැතිව සකස්කර තිබුණි. ප්‍රවර්තන වර්ෂයේ සිට එය ඇතුළත් කිරීමට කටයුතු කරනු ලබන බව. | චක්‍රලේඛ ප්‍රකාරව ක්‍රියාකාරී සැලැස්ම සකස් කළ යුතු වේ. |

**3.1.2 ප්‍රසම්පාදන සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 04 ඡේදය ප්‍රකාරව, සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්ම සකස් කර නොතිබුණි. | ප්‍රසම්පාදන සැලැස්ම සහ එහි ප්‍රගතිය ප්‍රවර්තන වර්ෂයේ සිට ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව | චක්‍රලේඛ ප්‍රකාරව වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්ම සකස් කළ යුතු වේ. |

**04. මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2020 දෙසැම්බර් 31 දිනට අනුමත සේවක සංඛ්‍යාව 103 ක් හා තථ්‍ය සේවක සංඛ්‍යාව 98 ක් වූයෙන් පුරප්පාඩු 05 ක් පැවතුණු අතර ඉන් දෙදෙනෙක් ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිලධාරීන් විය. | පිළිතුරු ලබා දී නොමැත. | අත්‍යාවශ්‍යව පවතින පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කළ යුතු වේ. |